PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2020.03.04

ජනාධිපති ලේකම් තුමා,

ජනාධිපති ලේකම් කාර්යාලය,

ගාලු මුවදොර,

කොළඹ 01.

ගරු ලේකම් තුමනි,

**මැතිවරණ කාලය තුළ රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම**

මේ වන විට පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත්කර ඇති අතර මැතිවරණය සඳහා දින ද නියම වී ඇත.

එහෙත් මෙම කාලය තුළ පත්වීම්, මාරුවීම් හෝ උසස්වීම් සිදු නොකළ යුතු වුවද දිස්ත්‍රික් කිහිපයකම එනම්, කළුතර, අනුරාධපුර, කුරුණෑගල, පොළොන්නරුව ආදී ප්‍රදේශවල මැතිවරණ කටයුතුවලට සම්බන්ධ වන විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන් මාරු කර ඇති බව වාර්තා වේ.

එමෙන්ම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් පිරිසකට ස්ථාන මාරුවීම් ලබාදී ඇති බවද වාර්තා වේ.

මැතිවරණයක් ආසන්නයේ හෝ මැතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති මොහොතක මැතිවරණ කටයුතු වලට ඍජු ලෙස සම්බන්ධ වන නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම මැතිවරණය පිළිබඳ ජනතාවගේ ඇති විශ්වාසය බිඳ වැටීමට බරපතල බලපෑමක් වන බැවින් මේ පිළිබඳ ඔබ තුමාගේ කාරුණික අවධානය යොමු කර මැතිවරණ කාලය තුළ, මැතිවරණයට බලපාන්නාවූ පත් කිරීම්, මාරු කිරීම් හා උසස් කිරීම් වැළැක්වීම සඳහා අදාළ අංශවලට උපදෙස් ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී.

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

පිටපත්
1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය
2. ලේකම්, පොලිස් කොමිෂන් සභාව
3. සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
4. උනන්දුවක් දක්වන සෙසු ආයතන

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

Scanned with CamScanner